**රජයේ නිවේදනයයි**

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

**2 වැනි වගන්තිය යටතේ නියමය**

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (i) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (ii) වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2022 ජූනි මස ....01.......... දින සිට ආරම්භ වන මාස 06 කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2022 මාර්තු මස 09 දිනැති අංක 2270/19 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත නියමය සහ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ පනවන ලද 2022 මාර්තු මස 28 දිනැති අංක 2273/01 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත නියමය 2022 ජූනි මස ....01..........වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**රනිල් වික්‍රමසිංහ**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ**
**ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය**

2022 මැයි මස ....31........ වන දින

කොළඹ 01,

මුදල් , ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති

අමාත්‍යාංශයේදීය.

# උපලේඛනය

| (i) වන තීරය | | | | (ii) වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01 | 04.03 | 0403.10 | යෝගට් | කි. ග්‍රෑමයට රු. 2000/- |
| | | 0403.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 2000/- |
| 02 | 04.05 | 0405.10 | වෙඩරු | කි.ග්‍රෑමයට රු. 1500/- |
| | | 0405.20 | කිරි වලින් නිපදවූ තැවරුම් | කි.ග්‍රෑමයට රු. 2000/- |
| | | 0405.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 2000/- |
| 03 | 04.06 | 0406.20 | සියළුම වර්ගවල පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි.ග්‍රෑමයට රු. 600/- |
| 04 | 08.04 | 0804.10.10 | රටඉඳි - අළුත් | කි.ග්‍රෑමයට රු. 200/- |
| | | 0804.10.20 | රටඉඳි - වියළි | කි.ග්‍රෑමයට රු. 200/- |
| 05 | 08.05 | 0805.10.10 | දොඩම්- අළුත් | කි. ග්‍රෑමයට රු. 600/- |
| 06 | 08.06 | 0806.10 | මිදි - අළුත් | කි. ග්‍රෑමයට රු. 600/- |
| 07 | | 0806.20 | මිදි - වියළි | කි. ග්‍රෑමයට රු. 600/- |
| 08 | 08.08 | 0808.10 | ඇපල් | කි. ග්‍රෑමයට රු. 600/- |
| 09 | 08.10 | 0810.90.90 | අනෙකුත්(පළතුරු) | කි.ග්‍රෑමයට රු. 600/- |

**Government Notification**

**Special Commodity Levy Act, No. 48 of 2007**

**Order under Section 2**

By virtue of the powers vested in me under Section 2 of the Special Commodity Levy Act No. 48 of 2007, I, Ranil Wickremesinghe, Minister of Finance, Economic Stabilization and National Policies of the Democratic Socialist Republic of Sri Lanka, do by this order impose in respect of the commodities specified in Column I of the Schedule hereto a Special Commodity Levy at the rate specified in the corresponding entries in Column II of that Schedule.

This Order shall be valid for a period of 06 months commencing from June 01, 2022 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

The Order made under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in the Extraordinary Gazette Notification No. 2270/19 of March 09 , 2022 and the Order made under Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in the Extraordinary Gazette Notification No. 2273/01 of March 28 , 2022 are rescinded with effect from June 01, 2022

**Ranil Wickremesinghe**
**Minister of Finance, Economic**
**Stabilization and National Policies**

May 31, 2022
Ministry of Finance, Economic Stabilization
and National Policies
Colombo 01,

# SCHEDULE

| Column I | | | | Column II |
|---|---|---|---|---|
| Commodity Item | | | | Special Commodity Levy |
| | H. S. Heading | H.S .Code | Description | |
| 1 | 04.03 | 0403.10 | Yogurt | Rs. 2000 per kg |
| | | 0403.90 | Other | Rs. 2000 per kg |
| 2 | 04.05 | 0405.10 | Butter | Rs. 1500.00 per kg |
| | | 0405.20 | Dairy spreads | Rs. 2000.00 per kg |
| | | 0405.90 | Other | Rs. 2000.00 per kg |
| 3 | 04.06 | 0406.20 | Grated or powdered cheese of all kinds | Rs. 600 per Kg |
| 4 | 08.04 | 0804.10.10 | Dates -Fresh | Rs. 200 per Kg |
| | | 0804.10.20 | Dates - Dried | Rs. 200 per Kg |
| 5 | 08.05 | 0805.10.10 | Oranges - Fresh | Rs. 600 per Kg |
| 6 | 08.06 | 0806.10 | Grapes - Fresh | Rs. 600 per Kg |
| 7 | | 0806.20 | Grapes -Dried | Rs. 600 per Kg |
| 8 | 08.08 | 0808.10 | Apples | Rs. 600 per Kg |
| 9 | 08.10 | 0810.90.90 | Other - fruits | Rs. 600 per Kg |